සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

29900

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2019
# Year End Evaluation


| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 06 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.......................................................... විභාග අංකය:-..................................................

සැලකිය යුතුයි.
- I පත්‍රයේ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමිවේ.

## I කොටස


01. දී ඇති වෘත්තය මත පිහිටන සේ A නම් ලක්ෂ්‍යයක් ද වෘත්තය පිටත B නම් ලක්ෂ්‍යයක් ද ලකුණු කරන්න.



02. 2 300 008 මෙම සංඛ්‍යාව කියවන ආකාරය ලියා දක්වන්න.

03. අගය සොයන්න. $350 \div 14$


04.




(i) ඉහත සංඛ්‍යා රේඛාවේ P මගින් නිරූපිත සංඛ්‍යාව කීය ද? ....................................

(ii) P හා R යන සංඛ්‍යා දෙකෙන් විශාල සංඛ්‍යාව කීය ද? ................................

05. රූපයේ දැක්වෙන




(i) සෘජු කෝණයක් නම් කරන්න. ..................................................

(ii) මහා කෝණයක් නම් කරන්න. ..................................................

06. ගුරු මේසය මත ගිනි පෙට්ටියක් තබා ඇත්නම් එහි දක්නට ඇති

(i) තිරස් දාර ගණන කීය ද?


(ii) සිරස් දාර ගණන කීය ද?


07. පහත දී ඇති භාග සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.

$\frac{1}{5}, \frac{1}{2}, \frac{1}{3}, \frac{1}{4}$

08. පහත දී ඇති ද්‍රව්‍යය කාණ්ඩ දෙකකට වෙන්කර රවුම් තුළ ලියා දක්වන්න.


| පෑන, කලිසම, මකනය, පැන්සල, කමිසය, බැනියම |
|---|

(i) 

(ii) 

09. රොම්බසයක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

10. රූපයේ පරිමිතිය සොයන්න.




11. 18 ප්‍රගණන ලකුණින් දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

12. අගය සොයන්න. 13.62 + 4.79

13. 4, 22 හි සාධකයක් ද නැද්ද යන්න හේතු සහිතව පැහැදිලි කරන්න.

14. $>$ හෝ $<$ අසමානතා ලකුණ ගැළපෙන පරිදි හිස්තැන් තුළ යොදන්න.

(i) 2.51 -------- 2.05

(ii) $\frac{28}{100}$ --------- $\frac{3}{10}$

15. පහත දැක්වෙන ප්‍රකාශනවලින් දැක්වෙන්නේ ඥාතයක් ද අඥාතයක් ද යන්න ඉදිරියෙන් ඇති තිත්මත ලියා දක්වන්න.

(i) අල 1kg ට අල්ලන අල ගෙඩි ගණන.....................................

(ii) සතියකට ඇති දින ගණන .......................................................

16. බස් රථයක සිටි මගීන් ගණන x වේ. ඉන් මගීන් 4 දෙනෙක් බැස ගිය පසු ඉතිරි වූ මගීන් ගණන දැක්වීමට වීජීය ප්‍රකාශනයක් ලියා දක්වන්න.

17. පොල් ගොඩක ඇති ගෙඩි ගණන ආසන්න දහයට වටැයූ විට ලැබුනු අගය 50කි. එම පොල් ගොඩෙන් ගෙඩියක් ඉවත් කර ආසන්න දහයට වටැයූ විට ලැබුනු අගය 40ක් නම් ගොඩෙහි තිබූ පොල්ගෙඩි ගණන කීය ද?

18. අගය සොයන්න.

| | මිනිත්තු | තත්පර |
|---|---|---|
| | 12 | 16 |
| − | 4 | 18 |
| | | |

19. ඇමරිකන් ඩොලර් 1ක වටිනාකම රු. 180ක් වූ දිනක ඇමරිකන් ඩොලර් 100ක් සඳහා ලැබෙන රුපියල් ගණන සොයන්න.

20. රුපියල් 2ක් හා ශත විසි පහක් අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

## II කොටස

- පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4කටත් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්නවලට ලකුණු 11 බැගින් ද ලැබේ.

01. (a) ඔබ පන්ති කාමරයේ දී ඉගෙනගත් ඝන වස්තු පාඩම ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ විසින් සකස්කළ ඝන වස්තු තුනක නම් ලියන්න.

(ii) ඉන් එක් ඝන වස්තුවක් සෑදීමට යොදාගත් පතරමක රූප සටහනක් ඇඳ දක්වන්න.

(iii) ඔබ සාදාගත් ත්‍රිකෝණාකාර මුහුනත් පමණක් සහිත ඝන වස්තුවේ දාර ගණන, ශීර්ෂ ගණන හා මුහුණත් ගණන වෙන වෙනම ලියා දක්වන්න.

(b) පංතියක ළමුන් පිරිසක් පළතුරු බීම සෑදීම සඳහා දොඩම් යුෂ ලීටර 2ක් හා දෙහි යුෂ 500*ml* ක් ගෙන එන ලදී.

(i) ගෙන ආ දොඩම් යුෂ ප්‍රමාණය මිලි ලීටර කීය ද?

(ii) දොඩම් යුෂ හා දෙහි යුෂ මිශ්‍රකර ඊට ජලය ලීටර 4ක්ද එකතු කර පළතුරු බීම සාදන ලදී නම් සාදාගත් බීම ප්‍රමාණය ලීටර හා මිලි ලීටර වලින් ලියන්න.

(iii) එක් ළමයකුට බීම 250*ml* බැගින් ලැබෙන සේ ළමුන් කී දෙනකු අතර සාදාගත් බීම ප්‍රමාණය බෙදාදිය හැකි ද?

(iv) බීම මිශ්‍රණයේ ඇති දොඩම් යුෂ, දෙහි යුෂ හා ජලය අතර අනුපාතය සරලම ආකාරයෙන් ලියා දක්වන්න.

02. ළමුන් පිරිසක් විසින් කිසියම් ක්‍රීඩාවක් සඳහා යොදා ගැනීමට ලියන ලද සංඛ්‍යා සටහනක් පහත දැක්වේ.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
| 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 |
| 15 | 16 | 17 | 18 | 19 | 20 | 21 |
| 22 | 23 | 24 | 25 | 26 | 27 | 28 |

(i) සටහනේ දැක්වෙන 10ට අඩු ඉරට්ට සංඛ්‍යා මොනවා ද?

(ii) එහි ඇති 18ත් 28ත් අතර වූ ප්‍රථමක සංඛ්‍යා තෝරා ලියන්න.

(iii) එහි දැක්වෙන විශාලතම සමචතුරස්‍ර සංඛ්‍යා දෙක ලියන්න.

(iv) සටහනේ දැක්වෙන 1ත් 10ත් අතර වූ ත්‍රිකෝණ සංඛ්‍යා ලියා දක්වන්න.

(v) 18 හි සියළු සාධක ලියා දක්වන්න.

03. වෙළෙන්දෙක් එක් දිනක විකුණන ලද ද්‍රව්‍යය පිළිබඳ විස්තරයක් පහත වගුවේ දැක්වේ.

| ද්‍රව්‍යය | විකුණූ ප්‍රමාණය | 1kgක විකුණුම් මිල |
|---|---|---|
| අල | 15kg | රු. 120 |
| ලොකු ළූණු | 5kg 500g | රු. 150 |
| පරිප්පු | 8kg | රු. 140 |

(i) විකුණන ලද පරිප්පු ප්‍රමාණය ග්‍රෑම් කීයද?

(ii) විකුණන ලද සියළු ද්‍රව්‍යවල ස්කන්ධය කොපමණ ද?

(iii) සියළුම ද්‍රව්‍යය විකිණීමෙන් එදින වෙළෙන්දා ලැබූ මුළු මුදල කොපමණ ද?

04. (i) $3 \times 3 \times 3 \times 3$ යන්න දර්ශක අංකනයෙන් ලියන්න.

(ii) $2^5$ යන්න ප්‍රසාරණය කර ලියන්න.

(iii) $2^2 \times 3^2$ හි අගය සොයන්න.

(iv) 16, 2 හි බලයක් ලෙස ලියන්න.

(v) $2^3$ හා $3^2$ යන අගයන්ගෙන් විශාලතම අගය සොයන්න.

05. කොටුව තුළ දී ඇති භාග ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

$$\frac{1}{4}, \frac{3}{4}, \frac{6}{8}, \frac{2}{9}, \frac{2}{3}, \frac{8}{12}, \frac{8}{9}$$

(i) ඒකක භාගයක් ලියා දක්වන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

(ii) $\frac{3}{4}$ සඳහා තුල්‍යය භාගයක් ලියා දක්වන්න.

(iii) $\frac{8}{12}$ සඳහා සරලම තුල්‍යය භාගය ලියා දක්වන්න.

(iv) සුළු කරන්න. $\frac{2}{9} + \frac{2}{3}$

(v) සුළු කරන්න. $\frac{3}{4} - \frac{1}{2}$

06. සනත් පළමු වාර පරීක්ෂණයේ දී විෂයයන් 5කට ලබාගත් ලකුණු පහත වගුවේ දැක්වේ.

| විෂයය | ලකුණු ගණන | වටැයූ විට අගය |
|---|---|---|
| ගණිතය | 77 | .......................... |
| ඉංග්‍රීසි | 65 | .......................... |
| විද්‍යාව | 72 | .......................... |
| සිංහල | 69 | .......................... |
| ආගම | 60 | .......................... |
| ඓක්‍යය | .......................... | .......................... |

(i) මෙම වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන එහි දැක්වෙන ලකුණු ගණන ආසන්න 10 ගුණාකාරයට වටයා ලියන්න.

(ii) සනත් ලබාගත් ලකුණුවල ඓක්‍යය හා එම ලකුණු වටැයූ විට ලැබුණු අගයන්ගේ ඓක්‍යය සොයන්න.


(iii) සනත් ලබාගත් මුළු ලකුණු ගණන හා වටැයූ පසු ලකුණු ගණනේ ඓක්‍යයන් අතර වෙනස කොපමණ ද?

07. (a) එක් දිනක් තුළ බස් රථයක් ගමන් ගත් වාර 4කදී ගමන් ගත් මගීන් ගණන පහත වගුවේ දැක්වේ.

 කින් මගීන් 10ක් දැක්වෙන සේ ඉහත වගුවේ දත්ත චිත්‍ර ප්‍රස්තාරයක් මගින් දක්වන්න.

| වාර ගණන | මගීන් ගණන |
|---|---|
| 1 වාරය | 55 |
| 2 වාරය | 70 |
| 3 වාරය | 60 |
| 4 වාරය | 45 |

(b) රූපයේ දැක්වෙන කුඩා සමචතුරස්‍ර කොටුවක පැත්තක දිග 1cm ක් වේ.




(i) ABCD රූපයේ පරිමිතිය කොපමණ ද?

(ii) රූපයේ අඳුරු කර ඇති කොටුවේ වර්ගඵලය කොපමණ ද?

(iii) මුළු රූපයේ වර්ගඵලය කොපමණ ද?